# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 369/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 01/03/2024 පැය 1930

## මාධ්‍ය නිවේදනය

### පාසල් දරුවන් මත් උවදුරින් මුදවා ගැනීමේ "සුරක්ෂිත හෙට දවසක් ව්‍යාපෘතිය" යටතේ විශ්වවිද්‍යාල සිසුන් බල ගැන්වීමේ වැඩමුළුව

**පාසල් දරුවන් මත් උවදුරින් මුදවා ගැනීමේ "සුරක්ෂිත හෙට දවසක් ව්‍යාපෘතිය"** යටතේ විශ්වවිද්‍යාල සිසුන් බල ගැන්වීමේ වැඩමුළුවක් ගරු පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් කොළඹ විශ්ව විද්‍යාලයේ උප කුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්.ඩී කරුණාරත්න මහතා සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපති ශාක්‍ය නානායක්කාර මහතාගේ සහභාගීත්වයෙන් 2024.03.01 වන අද දින කොළඹ විශ්වවිද්‍යාලයේ සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විණි.

ශ්‍රී ලංකා පොලිසිය, ජාතික තරුණ සේවා සභාව, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අධ්‍යාපන අමාත්‍යාංශය සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය එක්ව ක්‍රියාත්මක කරනු බලන මෙම  වැඩසටහන මඟින් විශ්වවිද්‍යාල සිසුන් පුහුණු කර පාසල් වලට යොමු කර මත්ද්‍රව්‍ය භාවිතයෙන් පාසල් දරුවන් මුදවා ගැනීම වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නියමිතයි.

මෙම අවස්ථාවේදී වැඩමුළුවට සහභාගී වූ කොළඹ විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින් විසින් ගරු පොලිස්පති තුමා වෙත සමරු තිළිණයක්ද පිරිනමන ලදී. මෙම අවස්ථාවට ගංගාරාම විහාරාස්ථානයේ පූජ්‍ය කිරින්දේ අස්සජි හිමියන් වැඩම කළ අතර, සබරගමුව පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සංජීව ධර්මරත්න මහතා, කෑගල්ල දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති රොෂාන් රාජපක්ෂ මහතා, කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨාධිපතිවරුන් සහ කොළඹ විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින් ඇතුළු පිරිසක් සහභාගී විය.


JEANS


FACTS








මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.